ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව - **2024**

-----------------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය වියාචනය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකිවිය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුව ද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 | | |
| (i) | සමාලෝචිත වර්ෂය තුළ කෙරීගෙන යන වැඩ සඳහා දරන ලද රු.3,695,306 ක පිරිවැය ප්‍රමිතියේ ඡේද අංක 16 (අ) ට පටහැනිව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හඳුනාගෙන නොතිබීමත්, දීර්ඝකාලීන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වර්ෂය තුළ ගෙවන ලද රු.22,659,424 ක වටිනාකම රු.70,820,258 ක් ලෙස හඳුනාගෙන තිබීමත් හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.44,465,528 කින් අඩු වී තිබුණි. | එකඟ වෙමි. විගණන විමසුමෙහි පෙන්වාදී ඇති සියලු කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව වැරදි නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | ප්‍රමිතියේ ඡේද අංක 31 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මුදලින් ලද රු.4,484,141 ක් වූ පොලිය සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව් කිරීමක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ සිදු කර නොතිබුණි. | එකඟ වෙමි. විගණන විමසුමෙහි පෙන්වාදී ඇති සියලු කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව වැරදි නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | ප්‍රමිතියේ ඡේද අංක 43 සහ 44 ට පටහැනිව රු.2,215,769 ක් වූ වසර 10කට අධික කාලයක සිට පැවත එන පරිත්‍යාග (Prompeached Receipt) සමුච්චිත ලාභයට ගැලපීම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලා ඒම් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | එකඟ වෙමි. විගණන විමසුමෙහි පෙන්වාදී ඇති සියලු කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව වැරදි නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී, දළ ණය ගැතියන් පදනම් කරගෙන කාරක ප්‍රාග්ධන වෙනස්වීම් හඳුනාගත යුතු වුවද සංස්ථාව විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පැවති ශුද්ධ ණයගැතියන් පදනම් කරගෙන කාරක ප්‍රාග්ධන වෙනස්වීම ගැලපීම හේතුවෙන් රු.2,461,611 කින් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩි වී තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී සිදුවී ඇති ගිණුම්කරණ දෝෂයන් නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය නැවත සකස් කිරීමට කටයුතු කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී, දල ණය ගැතියන් පදනම් කරගෙන කාරක ප්‍රාග්ධන වෙනස්වීම් හඳුනාගත යුතු වේ. |
| (v) | විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මෙහෙයුම් ආදායම තුළ ආදායම් ලෙස හඳුනාගන්නා ලද රු.1,259,793 ක දඩ සහ අධිභාර ඇතුළත්ව තිබියදී නැවත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල එම වටිනාකම බදුපෙර ලාභයට එකතු කිරීම හේතුවෙන් එම වටිනාකමින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වන්නා වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩි වී තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී සිදුවී ඇති ගිණුම්කරණ දෝෂයන් නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය නැවත සකස් කිරීමට කටයුතු කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දි ගැලපීම් නිවැරදිව සිදු කළ යුතු වේ. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ වෙළඳ ගෙවිය යුතු දෑ වෙනස්වීම රු.18,012,887 ක ධන බලපෑමක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ රු.17,902,867 ක ඍණ බලපෑමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් රු.35,915,754 කින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වන්නා වූ ශුද්ධ මුදල් ප්‍රවාහය අඩු වී තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී සිදුවී ඇති ගිණුම්කරණ දෝෂයන් නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය නැවත සකස් කිරීමට කටයුතු කරමි. | වෙළඳ ගෙවිය යුතු දෑ වෙනස්වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ නිවැරදිව හඳුනාගත යුතු වේ. |
| (vii) | පෙර ගෙවීම්වල වෙනස් වීම රු.4,778,452 ක ධන බලපෑමක් වුව ද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස් වීම් යටතේ ඍණ බලපෑමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් රු.9,556,904 කින් මෙහෙයුම් කටයුතු වලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය අඩු වී තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී සිදුවී ඇති ගිණුම්කරණ දෝෂයන් නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය නැවත සකස් කිරීමට කටයුතු කරමි. | පෙර ගෙවීම්වල වෙනස් වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස් වීම් යටතේ නිවැරදිව හඳුනාගත යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 | | |
| (i) | ප්‍රමිතියේ 42 සහ 43 වන ඡේද වල පෙන්වා දෙන පරිදි ඉකුත් වර්ෂයේ දී රුහුණු පුතා නෞකාව වෙනුවෙන් ඉන්ධන සැපයීමට අදාළව ප්‍රධාන කාර්යාලයෙන් බේරුවල වරාය වෙත ගෙවන ලද රු.5,272,100 ක ඉන්ධන සඳහා වූ වියදම මේ දක්වා වියදමක් ලෙස ගිණුම් නොතබා බේරුවල වරායේ මුදල් පොතට ප්‍රධාන කාර්යාලය විසින් හර කර තිබුණි. | එකඟවෙමි. 2025 වර්ෂයේ ජර්නල් අංක 30 මගින් පූර්ව වර්ෂ ගැලපීම් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | ප්‍රමිතියේ 42 වැනි ඡේදය ප්‍රකාරව පසුගිය වර්ෂයන් තුල සිදුවූ එකතුව රු.29,092,873 ක වැරදි නිවැරදි කිරීම් හෙළිදරව් නොකර සමුච්චිත ලාභයේ ආරම්භක ශේෂයට ගලපා තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 49 වන ඡේදය ප්‍රකාරව පෙර කාලපරිච්ඡේදයට අදාළ වැරදි නිවැරදිකිරීම ගැලපීම් කරනු ලබයි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | සංස්ථාවේ වරායන් 24 ක සමාලෝචිත වර්ෂයේ ඉන්ධන හා ගෑස් ආරම්භක තොගය සහ අවසාන තොගය වරායන්වල මෙහෙයුම් ලාභය ගණනයේදී සැලකිල්ලට ගෙන තිබියදී නැවත වරක් තොග අතර වෙනස වූ රු.33,354,672 ක වටිනාකම රඳවාගත් ඉපයුම් වලට හර කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | රඳවාගත් ඉපයුම් නිවැරදිව හඳුනාගත යුතු වේ. |
| (iv) | 2023 වර්ෂයේදී බේරුවල ධීවර වරායෙහි වෙන්දේසි ශාලාවේ වහලය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සඳහා දරන ලද රු.2,220,772 ක් එම වර්ෂයේ වත්කම් වලට හර නොකර වියදම් හර කිරීමේ වරද නිවැරදි කිරීමේදී ප්‍රවර්තන වර්ෂයේ අලුත්වැඩියා හා නඩත්තු වියදම් ගිණුමට බැර කර වත්කම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | එකඟවෙමි. නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | අදාළ වියදම අතීතානුයෝගී ලෙස මූල්‍ය ප්‍රකාශන තුල හඳුනාගත යුතුවේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 | | |
| (i) | ප්‍රමිතියට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.68,633,726 ක් වූ වත්කම් සඳහා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය ගණනය කිරීම හේතුවෙන් රු.2,478,109 කින් ලාභය ඌණ ගණනය වී සමුච්චිත ක්ෂය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී වැඩියෙන් ගණනය කර ඇති ක්ෂය ප්‍රමාණයන් නැවත ගිණුම් වලින් ගැලපීම් කර නිවැරදි කිරීමටත්,දේපළ පිරියත, උපකරණ වල ධාරණ අගය ගැලපුම් කර නිවැරදි කිරීමටත් සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | එම ප්‍රමිතියේ ඡේද අංක 7 හා 55 ට පටහැනිව 2024 වර්ෂයේ මිලදීගෙන තිබූ රු. 4,299,900 ක අමතර කොටස් 2025 ජූලි 03 වන දින යන්ත්‍රයට සවිකර තිබුණද 2024 වර්ෂයේ ප්‍රාග්ධනිත කර රු.429,999 ක් ක්ෂය ගැලපීම සිදු කිරීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවී රු. 3,869,910 කින් දේපළ පිරියත හා උපකරණ වල ධාරණ අගය වැඩිවී තිබුණි. එසේම 2021 වර්ෂයේ සිට භාවිතා කරමින් පැවති රු. 6,689,000 ක යන්ත්‍ර සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාග්ධනිත කළද පසුගිය වර්ෂ සඳහා | එකඟවෙමි.සමාලෝචිත වර්ෂයේ වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර තිබූ රු.4,299,900 ක වටිනාකම හා ක්ෂය ලෙස ගැලපුම් කර තිබූ ර.429,990 ක වටිනාකම 2025 වර්ෂයේ ජර්නල් අංක 26 මගින් ගැලපීම් සිදුකර ඇත. රු.6,689,000 ක් වටිනාකම් සහිත ඉන්ධන පොම්ප මිලදී ගැනීමට අදාළව, වරායන් විසින් භාණ්ඩ ලැබූ බවට නිකුත් කරන | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.1,736,183 ක ක්ෂය ගිණුම්ගත නොකිරීම නිසා රඳවාගත් ලාභය වැඩියෙන්ද සමුච්චිත ක්ෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දැක්වුණි. | GRN හි 2021 දෙසැම්බර් මස ලෙසත් දිනයන් සටහන් කර ඇත. යාන්ත්‍රික අංශය විසින් මුදල් අංශය වෙත කාර්යය නිමකළ බවට 2024 වර්ෂය ලෙස සඳහන් කර තිබූ බැවින් මෙම වත්කමට අදාළව 2024 වර්ෂයේ ක්ෂය ගැලපීම් සිදුකරන ලදී. මෙම වත්කම වරායන් වෙත සවිකර භාවිතයට ගත් දින සම්බන්ධයෙන් නැවත පරීක්ෂා කර බලා නිවැරදිව ක්ෂය ගණනය කර ගැලපුම් කිරීමට කටයුතු කරමි. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වර්ෂයේ ඉන්ධන අත්තිකාරම් ලෙස ගෙවන ලද රු. 129,102,045 ක් ගැනුම් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් විකුණුම් පිරිවැය වැඩිවී දළ ලාභය එම වටිනාකමින් අඩුවී තිබුණි. | එකඟවෙමි. 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඉන්ධන අවසන් තොග ලෙස හඳුනාගෙන නොතිබූ මාර්ගස්ථ තොග හා ගැනුම් ලෙස ගෙන නොතිබූ ඉන්ධන තොග නැවත පරීක්ෂා කර අදාළ වරායන්හි තොග වලට ගැලපුම් කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉන්ධන අත්තිකාරම් ලෙස ගෙවන ලද මුදල් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ණයට මිලදීගෙන තිබූ රු. 14,220,432 ක් වූ ඉන්ධන තොග ගැනුම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ලාභය වැඩිවී තිබූ අතර ණය හිමියන්ද එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි. | එකඟවෙමි. 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඉන්ධන අවසන් තොග ලෙස හඳුනාගෙන නොතිබූ මාර්ගස්ථ තොග හා ගැනුම් ලෙස ගෙන නොතිබූ ඉන්ධන තොග නැවත පරීක්ෂා කර අදාළ වරායන්හි තොග වලට ගැලපුම් කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉන්ධන තොග ණයට මිලදීගැනීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂයේ ඉන්ධන අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.58,580,899 ක් එම වර්ෂයේ ගැනුම් ලෙස ගිණුම්ගත කර තිබුණද, එම වරද නිවැරදි කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා සමුච්චිත අලාභය එම වටිනාකමින් වැඩිවී තිබුණි. | එකඟවෙමි. 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඉන්ධන තොග ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉකුත් වර්ෂයට අදාළ ඉන්ධන අත්තිකාරම් නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | ඉකුත් වර්ෂයේ ණයට මිලදීගෙන තිබූ රු. 38,125,799 ක් වූ ඉන්ධන එම වර්ෂයේ ගැනුම් ගිණුම හර කර ණයහිමි ගිණුම බැර කර නොතිබූ අතර එම වර්ෂයේ අවසන් තොගයට එකතු කර තිබුණි. ප්‍රවර්තන වර්ෂයේදී ඒ සඳහා මුදල් ගෙවීමේදී ගැනුම් ගිණුම හර කිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ගැනුම් වැඩිවී එම වටිනාකමින් ලාභය අඩුවී තිබුණි. | | ඉකුත් වර්ෂයට අදාළ ඉන්ධන ණයට මිලදීගැනීම් නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | අඩමාණ ණය වෙන්කිරීම සම්බන්ධයෙන් සංස්ථාවේ ප්‍රතිපත්තිය ලෙස තොරාගත් ණයගැතියන්ගෙන් සියයට 5 ක අඩමාණ ණය ලෙස රු.2,461,611 ක් වෙන්කිරීම් කළද ණය ගැතියන් තෝරා ගන්නා පදනම විගණනයට හෙළිදරව් කර නොතිබීම මත එහි නිවැරදිතාවය තහවුරු නොවීය. එසේම සංස්ථාවේ වාහන සහ අනෙකුත් යන්ත්‍ර වෙනුවෙන් අදාළ වරායන් තුලින් ලබාගන්නා ලද රු.80,364,155 ක් වූ ඉන්ධන වටිනාකම ණයගැතියන් ලෙස ගිණුම්ගත කර ඒ වෙනුවෙන් සියයට 5 ක අඩමාණ ණය ලෙස රු. 4,018,207 ක් ලාභයෙන් අඩුකර තිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදි ණයගැතියන් තෝරා ගන්නා පදනම හෙළිදරව් කිරිමට කටයුතු කරමි. සංස්ථා වාහන හා අනෙකුත් යන්ත්‍ර වෙනුවෙන් වරායන් වෙතින් ලබා ගන්නා ඉන්ධන සඳහා ගෙවිය යුතු වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇති අතර, හානිකරන අලාභ ලෙස ගිණුම්ගත කර ඇති වටිනාකම පරික්ෂා කර බලා නැවත ගිණුම් වලින් ගැලපීමට කටයුතු කර ඇත. | අඩමාණ ණය ලෙස තෝරා ගන්නා පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර සංස්ථාවේ වාහන සහ අනෙකුත් යන්ත්‍ර වෙනුවෙන් අදාළ වරායන් තුලින් ලබාගන්නා වූ ඉන්ධන සඳහා වූ වියදම් අදාළ වර්ෂය තුල වියදම් ලෙස හඳුනා ගත යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ වාහන සඳහා රු. 29,965,029 ක් වූ ඉන්ධන වරායන්වල ඉන්ධනහල් මඟින් ලබාගෙන ඇති අතර ඉන් රු.27,174,549 ක් ප්‍රධාන කාර්යාලය විසින් අදාළ වරායන් වෙත ගෙවා තිබුණි. ගෙවූ මෙම මුදල පමණක් වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් රු.2,790,480 කින් සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩියෙන් දැක්වුණි. | 2024 වර්ෂයට අදාළව ඉන්ධන වියදම් ලෙස හඳුනාගෙන නොතිබූ වටිනාකම වන රු.2,790,480 ක වටිනාකම පූර්ව වර්ෂ ගැලපීම් ලෙස ගිණුම්ගත කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | සමාලෝචිත වර්ෂය තුළ දරන ලද සමස්ත ඉන්ධන වියදම මූල්‍ය ප්‍රකාශන තුළ වියදම් ලෙස හඳුනාගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | මුදල් පොතට අනුව ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ බැංකු ශේෂය ලෙස සඳහන් විය යුතු වුවත්, කුඩාවැල්ල ධීවර වරායෙහි ඉන්ධන වලට අදාළ මුදල් ගිණුමේ රු.8,605,608 ක් අඩුවෙන්ද, අනෙකුත් ආදායම් වලට අදාළ මුදල් ගිණුමේ රු.5,647,889ක් වැඩියෙන්ද, අම්බලන්ගොඩ ධීවර වරායේ ඉන්ධන වලට අදාළ මුදල් ගිණුමේ රු.2,908,200 ක් වැඩියෙන්ද, සුදුවැල්ල ධීවර වරායෙහි ඉන්ධන වලට අදාළ මුදල් ගිණුමේ රු.904,901 ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | කුඩාවැල්ල ධීවර වරායේ ඉන්ධන හා විවිධ ආදායම් වලට අදාළ බැංකු ගිණුම්හි ශේෂයන් සිදුවූ අක්‍රමිකතාවයක් හේතුවෙන් මූලික ලියවිලි අස්ථානගත කර තිබූ අතර, පවතින මූලික ලේඛන පදනම් කරගෙන බැංකු සැසඳුම් වාර්තා පිළියෙළ කරන ලදී. මූලික ලියවිලි හා පොත්පත් නොමැති බැවින් මෙම ශේෂයන් නිවැරදි කිරීමට නොහැකි වී ඇත. ගිණුම්ගත කිරීමේදී ඇති වූ දෝෂයන් හේතුවෙන් අම්බලන්ගොඩ සහ සුදුවැල්ල ධීවර වරායන්හි බැංකු ශේෂයන්හි වෙනස්කම් සිදුවී ඇති අතර, නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | සංශෝධිත මුදල් පොතට අනුව නිවැරදි ශේෂය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතු වේ. |
| (ඌ) | වරායට ලැබෙන මුදල් දෛනිකව බැංකු ගත කළ යුතු වුවත් බේරුවල හා පානදුර ධීවර වරායන් අතැති මුදල් ශේෂය ලෙස රු.1,009,424 ක් හා රු.440,257 ක් වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරියට ගෙන එමින් පැවති අතර එම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | පානදුර හා බේරුවල ධීවර වරායන්හි අතැති මුදල් ශේෂයන් පරීක්ෂාකර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | වරායට ලැබෙන මුදල් දෛනිකව බැංකුගත කළ කළ යුතු අතර අදාළ ශේෂයන් කඩිනමින් බැංකු ගත කිරීමට පියවර ගත යුතු වේ. |
| (එ) | මූල්‍ය ප්‍රකාශන අනුව සංචිත වටිනාකම රු.7,663,412,677 ක් වූ අතර සටහන් අංක 05 මඟින් ඉදිරිපත් කර ඇති උපලේඛන අනුව එය රු.7,695,184,745 ක් වූයෙන් ශේෂ අතර රු. 31,772,068 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | සංචිත සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සටහන් මගින් නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඒ) | 2023 අංක 32 දරණ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී රු. 20,462,821,449 ක් වූ ඉන්ධන අලෙවිය හා රු.19,960,399,111 ක් වූ ඉන්ධන ගැනුම් මත එකතු කළ අගය මත බදු ගැලපීම සිදු නොකර මුළු වටිනාකමම ගිණුම්ගත කිරීම නිසා ඉන්ධන ආදායම හා ඉන්ධන වියදම අධිගණනය වී තිබුණි. | 2025 වර්ෂයේ පූර්ව වර්ෂ ගැලපීම් ලෙස නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ගැනුම් සහ විකුණුම් මත වූ එකතු කළ අගය මත බදු නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ඉන්ධන තොග - කුඩාවැල්ල ධීවර වරාය | 6,778,563 | 1,554,802 | 5,223,761 | කුඩාවැල්ල හා දොඩන්දූව ධීවර වරායන්හි ඉන්ධන තොගයන්හි වෙනස සොයාබලා නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | අදාළ උපලේඛන සහ අදාළ ලෙජර් ගිණුම් අතර පවතින වෙනස්කම් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතු වේ. |
| (ආ) | ඉන්ධන තොග - දොඩන්දූව ධීවර වරාය | 1,462,701 | 32,610 | 1,430,091 | | |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම
\

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණු එකතුව රු. 1,873,926,285 ක් වූ විවිධ ආයතන වලින් ලද ප්‍රදාන වලට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුනි. එසේම එකතුව රු.206,728,293 ක් වූ ණයගැති ශේෂ වලට අදාල උපලේඛන, කේවල ණයගැති ශේෂ, වයස් විශ්ලේෂණ හා මූලාශ්‍ර ලියවිලිද එකතුව රු.160,288,685 ක් වූ ණයහිමි ශේෂ හා රු. 8,610,910 ක් වූ දිවිසැරිය ගිණුමේ ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය මූලාශ්‍ර ලියවිලි, උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුනි. | විගණන විමසුමෙහි දක්වා ඇති ශේෂ සනාථකර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති ශේෂයන් ලෙස දක්වා ඇති ශේෂයන් බොහොමයක් දීර්ඝ කාලයක් තිස්සේ ගිණුම් හි ආරම්භක ශේෂයන් ලෙස පැවත එන අතර, මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීම සඳහා අවස්ථා කිහිපයකදීම කමිටු පත්කළ අතර, එම කමිටු වලටද ප්‍රමාණවත් සාක්ෂි සොයාගැනීමට නොහැකි විය.<br>මෙහි සඳහන් ඉඩම් , ගොඩනැගිලි , ආරක්ෂක ණය ගැති හා දික්ඔිවිට පැරණි ණය ශේෂ සඳහා උපලේඛන හා වයස් විශ්ලේෂණ රජයේ විගණන අංශය සඳහා ලබාදීමට කටයුතු කරමි. | අදාළ ශේෂයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය තුළ සංචිත වෙනස් වීම ලෙස රු.29,092,874 ක වටිනාකමක් සමුච්චිත අලාභයෙන් අඩුකර දක්වා තිබූ අතර එම වටිනාකම අඩුකිරීමට හේතු වූ කරුණු පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම වටිනාකමෙහි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය තුළ සංචිත වෙනස් වීම නිවැරදිව හඳුනාගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ වර්ෂය තුළදී සංචිත වෙනස් වීම ලෙස රු.24,494,262 ක වටිනාකමක් අඩුකර දක්වා තිබුණද, ඊට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එහි නිවැරදිතාවය තහවුරු නොවීය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | සංචිත වෙනස්වීම ලෙස හඳුනාගත් වටිනාකම සඳහා ඊට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 ජනවාරි , පෙබරවාරි , මාර්තු සහ ජූනි මාසවලට අදාළව කොඩ්බේ ධීවර වරාය විසින් නැගෙනහිර පළාත්සභා මන්ත්‍රීවරියකට අයත් ධීවර යාත්‍රා සහ වාහන සඳහා ඩීසල් ණයට සැපයීම වෙනුවෙන් ලැබිය යුතු රු.1,379,685 ක් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ණය මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම වරාය මෙහෙයුම් අංශය වෙත යොමුකර ඇත. | කඩිනමින් ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වරායන්වල දේපළ බාහිර පාර්ශවයන් වෙත කුලියට ලබා දීමට අදාළව ලැබිය යුතු ශේෂය රු.187,555,960 ක් වූ අතර එම ශේෂයෙන් වරායන් දහයකට අදාළ රු.156,998,780 ක් අවුරුදු 5 කට වඩා පැරණි ශේෂ විය. 2025 අගෝස්තු 21 දින දක්වාම අදාළ ශේෂයන් අයකර ගැනීමට සංස්ථාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලැබිය යුතු කුලී ආදායම්හි අවුරුදු 05ට වැඩි ශේෂයන් අයකර ගැනීමට සඳහා අදාළ පාර්ශවයන්ට විරුද්ධව නඩු පවරා ඇති අතර, එම නඩු කටයුතු තවමත් විභාග වෙමින් පවතියි. | අදාළ ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2013 වර්ෂයට පෙර සිට පැවත එන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයෙන් අය විය යුතු රු. 3,952,983 ක් වූ ලැබිය යුතු ආරක්ෂක ගාස්තු අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් බැවින් ගිවිසුම්ගත වීමකින් තොරව එම ආයතන වලට ආරක්ෂක සේවාව ලබාදීමට කටයුතු කර ඇත. විධිමත් ගිවිසුමක් නොමැතිවීම හේතුවෙන් රු.3,952,983 ක ලැබිය යුතු වටිනාකම් අයකර ගැනීම ගැටළු සහගත වී ඇත. | අය කර ගැනීම සඳහා සුදුසු පියවර ගැනීම සිදු කළ යුතු වේ. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය තුල ඇතුළත් දිගු කාලයක සිට පැවත එන රු.36,071,363 ක ශේෂයන් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | ණය හිමි වටිනාකම තුල ඇති රු. 36,071,363 ක ශේෂයන් දිගුකාලය සිට දිගින් දිගින් දිගටම පැවත එන ශේෂයන් වන අතර, මේ සම්බන්ධයෙන් 2025 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. | නිරවුල් කිරීමට සුදුසු පියවර කඩිනමින් ගත යුතු වේ. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හා 2014 අංක 07 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත | | | |
| (i) | 26 වන වගන්තිය | යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද එම බදු අය කළ හැකි කාලසීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ 20 වන දිනට පසු දිනයක් නොවන දිනයක ගෙවිය යුතු වුවත් 2025 අප්‍රේල් 30 දිනට නොගෙවූ 2024 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අදාළ එකතු කළ අගය මත බදු බැදියාව රු.26,325,272 ක් විය. | මෙම වටිනාකම 2025 ජනවාරි මස පියවීමට කටයුතු කර ඇත. | එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව නියමිත දිනවලදී ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | 22 (2) සහ 22 (6) (III) වගන්ති | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව වර්ෂ 10 කට පමණ අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු. 14,175,147 ක් වූ අතර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් දිගු කාලයක් තිස්සේ පැවත එන ශේෂයන් වන අතර, මේ සම්බන්ධයෙන් මූලික පොත්පත් නැවත පරීක්ෂා කර 2025 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම පිළිබඳ සොයා බලා අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ. 135 | දික්ඕවිට ධීවර වරායෙන් ලබාගත් ඉන්ධන ගෙවීම් වවුචර් නියැදියකින් ගෙවීම් වවුචර් 4 කට අදාළව රු. 57,137,850 වටිනාකමක් සඳහා ගෙවීම් වවුචර් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | චෙක්පත් අත්සන් කිරීමේ බලය වරාය කළමනාකරු සහ තවත් නිලධාරියෙකු සඳහා පවරාදී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත් වන අතර වරායන් වෙතින් ගෙවීම් සිදු කරනු ලබන්නේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත පමණි. එමෙන්ම ගෙවීම් සහතික කිරීම සඳහා වෙනත් නිලධාරියෙකු වරාය තුල නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වවුචර් සහතික කිරීමකින් තොරව ගෙවීම් සිදු කිරීම නොකළ යුතු වේ. |
| (ii) | මු.රෙ. 262 (2) | දික්ඕවිට ධීවර වරාය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරනු ලබන කිසිඳු ගෙවීම් වවුචරයක " ගෙවන ලදි " මුද්‍රාව යොදා නොතිබුණි. | ඉන්ධන මිලදී ගැනීමේදී ගෙවීම් වවුචර්පත් නිසි ආකාරව පිළියෙළ කරන ලෙසට වරාය කළමනාකරු වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට නිවැරදිව එම ක්‍රියාවලිය සිදු වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | මු.රෙ. 502(2) | මුදල් රෙගුලාසි ප්‍රකාරව ස්ථාවර වත්කම් රෙජිස්ටරයක් සංස්ථාව විසින් පවත්වාගෙන නොතිබුණි. | නියමිත පරිදි සකස් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ස්ථාවර වත්කම් රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 19 වගන්තියෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැති අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධ කටයුතු නිමකළ බවට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ වෙත ජුනි 30 දිනට පෙර වාර්තා කර නොතිබුණි. | ඉදිරියේදී එම වාර්තා නිසි පරිදි යොමුකිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පළමු වන ඛාණ්ඩයේ VII වැනි පරිච්ඡේදයේ 7.8 වන වගන්තිය | නිලධාරියෙකුගේ වැටුප් රහිත නිවාඩු දින සඳහා (Nopay) අය කර ගැනීම් ගණනය කිරීමේදී ඔහුගේ නිත්‍ය තනතුරට හිමි ඒකාබද්ධ වැටුප, ජීවන වියදම් දීමනාව හා වෙනත් දීමනා වේ නම් ඒවාද ඇතුළත් කළ යුතු වුවත් සංස්ථාව විසින් නිලධාරීන්ගේ මූලික වැටුප පමණක් පදනම් කර ගනිමින් වැටුප් රහිත නිවාඩු දින සඳහා (Nopay) අය කර ගැනීම් ගණනය කර තිබුණි. | වැටුප් රහිත නිවාඩු දින සඳහා අයකර ගැනීම් ගණනය කිරීමේදී ආයතන සංග්‍රහය පළමු වන කාණ්ඩයේ vii වැනි පරිච්ජේදයේ 7.8 වන වගන්තිය ප්‍රකාරව ගණනය කිරීම් මෙවන විට සිදු කරන බව දන්වා සිටිමි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව වැටුප් රහිත නිවාඩු දින සඳහා අයකර ගැනීම් ගණනය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 1/2015 , 2016 ඔක්තෝබර් 26 දිනැති PED1/2015(i) සහ 2022 ජනවාරි 14 දිනැති PED1/2015(ii) | මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩලය හෝ අමාත්‍යාංශ ලේකම්ගේ නිසි අනුමැතියක් ලබා ගත යුතු අතර සංස්ථාව විසින් එසේ අනුමැතිය ලබා නොගෙන රු. 1,410,485 ක වටිනාකමකින් යුතු ඉන්ධන ලීටර් 4,070 ක් නිලධාරීන් 5 දෙනෙකු වෙත නිකුත් කර තිබුණි. | අනුමැතිය ලබා නොගත් ඉන්ධන දීමනා වෙනුවෙන්, අනුමැතිය ලබාගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් සකස් කර ඔක්තෝම්බර් මස පැවැත්වීමට නියමිත අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව අතිරේක ඉන්ධන සම්බන්ධයෙන් නිසි අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) | 4.2.1 ඡේදය | අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කළ යුතු වුවද සංස්ථාව විසින් වසර 03 ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර නොතිබුණි. | වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැත. | වසර 03 ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 4.2.2 ඡේදය | සංස්ථාව විසින් 2024 වර්ෂය සඳහා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහන සකස් කර නොතිබුණු අතර සිදු කළ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | 2024 වර්ෂය සඳහා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහන සකස් කර නොමැති අතර 2025 වර්ෂය වෙනුවෙන් සකස් කිරීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන කාලසටහන සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර සඳහා වන මාර්ගෝපදේශයෙහි 2.3 ඇමුණුම් 1 හි 3 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු වාර්ෂික අයවැය ලේඛනයේ අයවැයගත ආදායම් ප්‍රකාශය, අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් කර නොතිබුණු අතර පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් සඳහා පමණක් අයවැයගත ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ලේඛනයේ අයවැයගත ආදායම් ප්‍රකාශය, අයවැයගත මූල්‍යතත්ව ප්‍රකාශනය, අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස්කර රජයේ විගණන අංශය වෙත යොමුකිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය තුල අයවැයගත ආදායම් ප්‍රකාශය, අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් කළ යුතු වේ. |

**1.8 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුදුවැල්ල ධීවර වරායෙහි අනෙකුත් ආදායම් ගිණුමට අදාළ බැංකු ජංගම ගිණුම වෙනුවෙන් පිළියෙල කර තිබුණු 2024 දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි 2023 පෙබරවාරි මස ඉන්ධන ගිණුම සඳහා තැන්පත් කරන ලද රු.31,610 ක්, 2023 දෙසැම්බර් මස ඉන්ධන ගිණුම සඳහා තැන්පත් කරන ලද රු.47,374 ක් සහ බැංකු ගත නොකරන ලද අනෙකුත් ආදායම් රු.248,102 ක් තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ ලෙස සඳහන් කර තිබුණු අතර එම ශේෂ සම්බන්ධයෙන් සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2025.09.18 දින නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ ලෙස සඳහන් කර තිබුණු තැන්පතු සොයා බලා නිරවුල් කිරීමට කටයුතු සිදු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.100,708,340 ක අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ලාභය රු.640,377,110 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 741,085,450 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන හා මෙහෙයුම් ප්‍රතිඵලය පිළිවෙලින් රු.314,447,520 කින් හා රු. 323,929,418 කින් අඩු වීම ද, කාර්ය මණ්ඩල වියදම් හා පරිපාලන වියදම් පිළිවෙලින් රු. 79,196,133 කින් හා රු.53,674,773 කින් වැඩිවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 නොවැම්බර් 29 වන දින පෞද්ගලික ආයතනයක් විසින් දික්ඕවිට ධීවර වරාය උතුරු පර්යන්තයේ භූගත ඉන්ධන බට සවිකිරීමේ දී ලීටර් 2,700 ක් පමණ ඉන්ධන කාන්දුවක් සිදු වී තිබුණද 2025 මැයි 22 දින වන විට වර්ෂ පහක් ගත වී ඇතත් එම ඉන්ධන කාන්දුව අදාළ ආයතනය වෙතින් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශයෙන් සිදුකරන ලද පරීක්ෂණ වාර්තාවේ සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකර අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ඇත. | අදාළ ආයතනය වෙත මුදල් ගෙවීම සිදුකර තිබේද යන්න පරීක්ෂා කිරීම සහ ගිවිසුම් පරීක්ෂා කර අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.143,041,969 ක් වූ කෙරීගෙන යන වැඩ යටතේ ඇති රු.29,156,788 ක ශේෂයන් වසර ගණනාවක සිට ඉදිරියට ගෙනඑමින් පැවතියද එම ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.29,156,788.00 ක වටිනාමකින් යුතු කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇති ශේෂයන් දීර්ඝ කාලයක් සිට පැවත එන ශේෂයන් වන අතර මේ සම්බන්ධයෙන් තොරතුරු සිවිල් අංශය වෙතින් ලබාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමි. | කෙරීගෙන යන වැඩ සම්බන්ධයෙන් හානිකරණය සඳහා වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගැනීම සිදු කළ යුතු වේ. |
| (ඇ) | 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරියට කළ ගෙවීම් රු. 40,747,319 ක් වන අතර එම ශේෂයෙන් 2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ ශේෂය රු.21,130,672 ක් විය. ඉදිරියට කළ ගෙවීම් වලට අදාළ ශේෂයන් පිළිබඳ සොයාබලා නිරවුල් කිරීම සඳහා සංස්ථාව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයට අදාළව ලබාදී තිබූ පෙර ගෙවීම් සියල්ල නිරවුල් කර ඇති අතර,2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිරවුල් නොවූ ශේෂයන් සම්බන්ධයෙන් තොරතුරු විමසා ප්‍රසම්පාදන අංශය වෙත යොමුකර ඇත. | ඉදිරියට කළ ගෙවීම් වලට අදාළ ශේෂයන් පිළිබඳ සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා බේරුවල වැඩ ඒකකයේ අලාභය අඛණ්ඩව වැඩිවී තිබුණු අතර එම අලාභ තත්ත්වය 2023 වර්ෂයේ රු.25,229,770 ක් සහ 2024 වර්ෂයේ රු.25,153,706 ක් විය. | බේරුවල කර්මාන්ත ශාලාවේ සංස්ථාවෙහි යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම් පමණක් සිදු කරන අතර, වෙනත් බාහිර කාර්යයන් සිදු නොකරයි. එබැවින් විශේෂ ආදායමක් උත්පාදනයක් සිදු නොවන අතර කර්මාන්තශාලාවෙහි වැඩකරන සේවක වේතන , නඩත්තු වියදම් හේතුවෙන් දිගින් දිගටම බේරුවල කර්මාන්තශාලාව අලාභ ලබන තත්වයක් පෙන්නුම් කරනු ලබයි. | ආදායම් උත්පාදනය සහ වියදම් පාලනය සම්බන්ධයෙන් පියවර ගැනීම තුළින් අලාභ තත්ත්වය පාලනය කර ගැනීමට කටයුතු කළ යුතු යුතු වේ. |
| (ආ) | දික්ඕවිට ධීවර වරායේ උතුරු පර්යන්තය සතුව ඉන්ධන පොම්ප 07 ක් පවතින අතර 2025 මැයි 22 වන දිනට ක්‍රියාකාරී තත්ත්වයේ පැවතියේ පොම්ප 03ක් පමණි. ක්‍රියා විරහිත පොම්ප 04 න් එක් පොම්පයක mother board එක 2022 අගෝස්තු 01 දින අදාළ සැපයුම් ආයතනය විසින් අළුත්වැඩියා කටයුතු සඳහා ගලවා ඉවත්කර ගෙන ගොස් තිබුණු අතර 2025 මැයි 22 දින වන විටත් සංස්ථාව විසින් ඒ පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි. තවත් පොම්පයක් 2018 අගෝස්තු 14 දින සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. 2017 අප්‍රේල් 05 දින සවිකර තිබුණු පොම්පය සවිකළ දින සිටම ක්‍රියාකාරීව නොපැවතුණු අතර ඉතිරි පොම්පය 2021 දෙසැම්බර් 23 දින සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. | මෙම පොම්පය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස යාන්ත්‍රික අංශය වෙත උපදෙස් දෙන ලදී. පෞද්ගලික සමාගමකින් මිලදී ගත් සියලු පොම්ප ඉන්ධන නිකුත් කිරීමේ වේගය ඉතා අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ධීවර විරෝධතාවයන් පැන නැගුනු අතර, මේ හේතුවෙන් එම පොම්පයන් භාවිතා කිරීම ගැටළු සහගත විය. මෙම පොම්පයන් සඳහා අත්තිකාරම් මුදලක් පමණක් ගෙවීම් සිදුකළ අතර වෙනත් කිසිදු ගෙවීමක් සිදුකර නොමැත. | සැපයුම් ආයතනය විසින් අළුත්වැඩියා කටයුතු සඳහා ගලවා ඉවත්කර ගෙන ඇති mother board නැවත ගෙන්වා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු අතර අනෙකුත් පොම්ප කඩිනමින් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013 ජනවාරි 17 දින නිලධාරීන් 1015 ක කාර්යය මණ්ඩලයක් අනුමත කර තිබුණු අතර සංස්ථාවේ 2025 ජූලි 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 1308 ක් විය. මේ තුල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද නිලධාරීන් 433 ක් ද ඇතුළත්ව තිබුණි. | කාර්යමණ්ඩල සංශෝධනය කර ,අනුමත කර ගැනීම සඳහා අමාත්‍යංශ ලේකම් වෙත යොමුකර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වෙතින් අතිරේක තනතුරු සඳහා අනුමැතිය ලබා ගත යුතු වේ. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් සංස්ථාව විසින් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 115 ක ප්‍රමාදයක් සහිතව එනම් 2025 ජූනි 23 දිනදීය. | 2025 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන හා වාර්තා නියමිත දිනයන් හිදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයන්හිදී ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දික්ඕවිට ධීවර වරාය උතුරු පර්යන්තයේ කැලි කසල අපද්‍රව්‍ය බැහැර කිරීම කුලී පදනම මත පෞද්ගලික පාර්ශවයන් මඟින් සිදුකර තිබුණද එම පාර්ශවය මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් තරනු ලබන පාරිසරික බලපත්‍රයක් ලබාගැනීම සිදුකර නොතිබූ අතර ඒ අනුව කසල බැහැර කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කර තිබුණේද යන්න විගණනයට පැහැදිලි නොවීය. | දික්ඕවිට ධිවර වරායෙහි නිරන්තරයෙන් එකතුවන අපද්‍රව්‍ය විධිමත් අයුරින් බැහැර කිරීම සඳහා වත්තල ප්‍රාදේශීය සභාව සමග සාකච්ඡා කර දැනට දිරාපත් වන කුණු පමණක් වරාය භූමියෙහි වලක් කපා වැළලීමට ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇත. දිරාපත් නොවන පොලිතින් ආදී අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින්ම රැගෙන යාමට කටයුතු කරන බවට දන්වා ඇත. ඒ අනුව අපද්‍රව්‍ය රැගෙන යාම වෙනුවෙන් පුද්ගලික අංශය වෙත කරන ලද ගෙවීම් මේ වනවිට නතර කර ඇති බව දන්වා සිටීම. | පරිසර අධිකාරිය විසින් නිකුත් තරනු ලබන පාරිසරික බලපත්‍රයක් ලබාගැනීම සිදුකර ඒ අනුව කසල බැහැර කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වේ. |